# පන්නිපිටිය ධර්මපාල විද්‍යාලීය ආදි ශිෂ්‍ය සංගමයේ
# පෙරමග දශක කණ්ඩායම විසින් 2019 පෙබරවාරි මස 10 වන දින පවත්වන ලද
# 13 වන මහ සභා වාර්තාව

**සහභාගිත්වය**

රුසිරු වගීෂ බැලගම - සභාපති
වෙනුර කසුන්සිරි - ලේකම්
චමිල කසුන් දසනායක - භාණ්ඩාගාරික

**අනුශාසකත්වය**

වර්තමාන විදුහල්පති ඔෂාර පණ්ඩිතරත්න මහතා

**ප්‍රධානත්වය**

ආදි ශිෂ්‍ය සංගමයේ ගරු නියෝජ්‍ය සභාපති නොමන් රණසිංහ මහතා
ආදි ශිෂ්‍ය සංගමයේ ගරු ලේකම් ලලිත් වැලිකල මහතා

**ආරම්භය**

ක්‍රි.ව 2019ක් වු පෙබරවාරි මස 10 වන දින පෙ.ව 9.00 ට විද්‍යාලීයය ශාලාවේ දී සියලු පාර්ශවයන්ගේ සහාභාගිත්වයෙන් ආගම සිහි කරිමෙන් අනතුරුව අප අතරින් වියෝ වු රණවිරුවන්, ආදි ධර්මපාලියන් සැමරීම වස් විනාඩියක නිශ්ෂබ්දතාවයකින් හා පාසල් ගීතය ගායනා කිරීමෙන් අඅනතුරව සභාවේ වැඩකටයුතු ආරම්භ විය.

**පිළිගැනිමේ කථාව**

12 වන මහා සභාව රැස්විමට පැමිණි සියළු දෙනා පිළිගනිමින් ගරු ලේකම් වෙනුර කසුන්සිරි මහතා සභාව අමතන ලදී. එහිදී අප ආරාධනාව පිළිගනිමින් පැමිණි ගරු විදුහල්පතිතුමන්, නොමන් රණසිංහ ගුරු පියාණාන්, ලේකම් ලලිත් වැලිකල මැතිතුමන් හා පැමිණ සිටින සියලුම දෙනා පිළිගනිමින් අද දවසේ අරමුණ පැහැදිලි කරන ලදි. එමෙන්ම මෙම වසර සාර්ථකව කර ලැනිම සඳහා දායකත්වය දැක්වු සියලු දෙනාටම ද ස්තුතිවන්ත වන බව පවසමින් තම ස්තුති කථාව නිම කරන ලදී.

**වාර්ථාව සභා සම්මත කර ගැනිම**

පැමිණ සිටින සියලු දෙනා වෙත ලබා දී තිබු 11 වන මහ සභා වර්තාව නිෂාදි රුක්ෂාණි මහත්මියගේ යෝජනාවෙන් හා දිනේෂා නදීශානි මහත්මියගේ ස්ථිරත්වයෙන් සත්‍ය වර්තාවක් ලෙස සභා සම්මත විය.

එමෙන්ම 2018 ජුලි මස 15 වන දින පැවති අතුරුමහ සභා වර්තාව යසන්ත ඉන්දිවර මහතාගේ යෝජනාවෙන් හා මේබලා නදීශානි මහත්මියගේ ස්ථිරත්වයෙන් සත්‍ය වර්තාවක් ලෙස සභා සම්මත විය.

**ප්‍රගති සමාලෝචනය**

2018 / 2019 පරිපාලන වර්ෂයේ දි අප සංගමය මගින් සිදුකරන කරන ලද ව්‍යාපෘති පිළබඳ ප්‍රගති සමාලෝචනය ගරු සභාපති රුසිරු වගීෂ බැලගම මහතා විසින් සභාවට ඉදිරිපත්

කරන ලදී. එමෙන්ම මෙම වසර සාර්ථකව කර ලැනිම සඳහා දායකත්වය දැක්වූ සියලු දෙනාටම ද ස්තුතිවන්ත වන බව පැවසු රුසිරු වගීෂ බැලගම මහතා, 6-9 ශ්‍රේණි සඳහා ඉදි කරන ලද වැසිකිළි කැසිකිළි පද්ධතිය පිළිබඳව විශේෂ ප්‍රගති සමාලෝචනයක් සිදු කිරීමට බුද්ධික ධනුෂ්ක මහතාට අරාධනා කරන ලදි.

එහිදි බුද්ධික ධනුෂ්ක මහතා විසින් 6-9 ශ්‍රේණි සඳහා ඉදි කරන ලද වැසිකිළි කැසිකිළි පද්ධතියේ මුලික අදියරේ සිට අවසාන අදියර දක්වා ක්‍රියාවලිය පිළිබඳ සවිස්ථර විස්තරයක් ඉදිරිපත් කරන ලද අතර ඒ සදහා දායකත්වය දැක්වූ සියළුම දෙනාට ස්තුති කරන ලදි.

එමෙන්ම ගරු ලේකම් වෙනුර කසුන්සිරි මහතාද 6-9 ශ්‍රේණි සඳහා ඉදි කරන ලද වැසිකිළි කැසිකිළි පද්ධතිය වෙනුවෙන් දායකත්වය දැක්වූ සියළුම දෙනාට ස්තුති කරන ලදි.

**ගිණුම් වාර්ථාව**

ගරු භාණ්ඩාගාරික චමිල කසුන් දසනායක මහතා වර්ෂයට අදාළ ගිණුම් වර්තා සභාවට ඉදිරිපත් කරන ලද අතර එය සංසෝධන රහිතව දිනේෂා නදීශානි මහත්මියගේ යෝජනාවෙන් හා චමිදු විජයවර්ධන මහතාගේ ස්ථිරත්වයෙන් සත්‍ය වර්තාවක් ලෙස සභා සම්මත විය.

**ගරු විදුහල්පතිතුමාගේ කථාව**

පෙරමග කණ්ඩායම ආදි ශිෂ්‍ය සංගමයේ ශක්තිමත්ම කණ්ඩායම බව ප්‍රකාශ කල විදුහල්පතිතුමා ලොකු ශක්තියක් හා ජවයක් කණ්ඩායම තුළ දත්නට ලැබෙන බව පවසන ලදී.
එමෙන්ම 6-9 ශ්‍රේණි සඳහා නවින පහසුකම් වලින් සමන්විත වැසිකිළි කැසිකිළි පද්ධතියක් ඉදිකිරීම මගින් සිසුන්ගේ සනිපාරක්‍ෂන මට්ටම ඉහල නැංවීමට කටයුතු කිරීම පිළිබඳ පෙරමග කණ්ඩායමට විශේෂයෙන් ස්තුති කරන ලදි.
තවද දැනට පාසලේ ක්‍රිඩා පිටියේ සංවර්ධනය කටයුතු අවසන්ව ඇති බවත් ඒ සදහා දායකත්වය ලබා දුන් සැමට ස්තුති කරන ලදි.
පෙරමග සෑම අවස්ථාවකදිම තිරණාත්මක සාධකයක් බවත් ඉදිරියටත් පාසලේ අභිවෘද්ධිය වෙනුවෙන් සහය ලබා දෙන ලෙස ඉල්ලමින් තම කථාව අවසන් කරන ලදි.

**ගරු නියෝජය සභාපතිතුමාගේ කථාව**

පසුගිය වර්ෂය තුල පාසලේ සහා පාසල් සිසුන්ගේ අභිවෘර්ධිය වෙනුවෙන් පෙරමග කණ්ඩායම සිදුකළ මෙහෙය පිළිබඳව නොමන් රණසිංහ ගුරුපියාණන් විසින් අගය කරන ලදි. පාසල තමගේ මහා ගෙදර ලෙස සළකා සැම විටම පාසලේ කටයුතු වෙනුවෙන් තම උපරිම සහයෝගය ලබ දෙන ලෙස ඉල්ලා සිටි අතර ඉදිරි වර්ෂයේදිත් පාසල වෙනුවෙන් සහය ලබා දෙන ලෙස ඉල්ලමින් තම කථාව අවසන් කරන ලදි.

**ගරු ලේකම්තුමාගේ කථාව**

ආදි ශිෂ්‍ය සංගමය තුළ මව් සංගමයට පසුව සිටින ක්‍රියාකාරිම සංගමය පෙරමග කණ්ඩායම බව ප්‍රකාශ කළ ලලිත් වැලිකල මහතා පෙරමග කණ්ඩායම තුල පවතින ජවය හා ශක්තිය මගින් පාසලට සිදුවන සේවාව ඇගයිමට ලක් කරන ලදි.
පසුගිය වර්ෂය තුල පෙරමග කණ්ඩායම මගින් සිදුකල සිසුන්ගේ සනිපාරක්‍ෂන මට්ටම ඉහල නැංවීමේ ව්‍යාපෘතිය හා ඩෙස් පුටු පිළිසකර කිරිමේ ව්‍යාපෘතිවල ප්‍රගතිය පිළිබඳ ප්‍රසංසා කළ වැලිකල මහතා ඉදිරි වර්ෂය සාර්ථක කර ගැනිමට අළුතින් පත්වන නිළදාරි මණ්ඩලයට සුභ පතමින් තම කථාව අවසන් කරන ලදි.

ඉන් පසුව පසුගිය වර්ෂයේ නිළදාරි මණ්ඩලය ඉල්ලා අස්වී නව නිළදාරි මණ්ඩලයක් සභාවේ බහුතර කැමැත්ත පරිදි තොරා පත් විය.

| **තනතුර** | **නම** |
|---|---|
| සභාපති | බුද්ධික රොෂාන් |
| ලේකම් | ගයානි ශානිකා කොස්වත්තගේ |
| භාණ්ඩාගාරික | වෙනුර කසුන්සිරි |
| උප සභාපති | සුලක්ෂණ විදුරංග, පෙවින්ද බැලගම<br>දිලිප තුෂාර |
| උප ලේකම් | දිනේෂා නදීශානි ජයමාන්න<br>ශමේන්ද්‍ර ධර්මසේන, නිෂාදි රුක්ෂාණි |
| උප භාණ්ඩාගාරික | චමිදු විජයවර්ධන |
| සංවිධායක | ශිවන්ත කොස්වත්තගේ |
| උප සංවිධායක | කසුන් මධුෂංඛ |
| සංස්කාරක | ධංජය ඇල්විටිගල |
| ද්වි වාර්ෂික සංවිධායක | රසික මධුෂංක |
| කාරික සභික- 2001 | චරිතා සෙනෙවිරත්න<br>අමිල මෛත්‍රීපාල |
| කාරික සභික- 2002 | ගීතික පෙරේරා<br>අප්සරා මධුවන්ති |
| කාරික සභික- 2003 | දිලිනි ලංකිකා ලියනගේ<br>වරුණ විජයසේකර |
| කාරික සභික- 2004 | මහවත්තගේ රොෂන මධුෂංක<br>තිළිණි ශ්‍යාලිකා තිලකරත්න |
| කාරික සභික- 2005 | සුමුදු ගීගනගේ<br>රංග දිලාන් පෙරේරා |
| කාරික සභික- 2006 | මේඛලා නදීශානි ප්‍රනාන්දු<br>ජේ.ඩබ්ලිව්.එන් සාලින්ද |
| කාරික සභික- 2007 | අරුණි මහේෂිකා<br>නදීෂා රජිනි |
| කාරික සභික- 2008 | ඩබ්ලිව්.ඒ.ටි මධුරංගි<br>යසන්ත ඉන්දිවර |
| කාරික සභික- 2009 | හර්ෂ ප්‍රියන්ත<br>ගිහාන් චතුරංග |
| කාරික සභික- 2010 | ඉෂානි අනුරුද්ධිකා |
| 2018/2019 පරිපාලන වර්ෂයේ සභාපති | වගීෂ බැලගම |

**නව සභාපතිතුමාගේ කථාව**

සංගමයේ ඉදිරි කටයුතු සදහා සියළුම පෙරමග සමාජික සමාජිකාවන්ගේ දායකත්වය අපෙක්ෂා කරන බව නව සභාපතිතුමා පවසන ලදි. එසේම පෙරමග සමාජික සමාජිකාවන්ගේ දරුවන් පළමු වසර සදහා ඇතුලත් කර ගැනිමේ ක්‍රියාවලියේදී අදි ශිෂ්‍ය සංගමය මගින් ලබාදිය යුතු සහයෝගය පිළිබද වැඩ සටහනක් සකස් කිරිමේ වැදගත්කම ප්‍රකාශ කරන ලදි.

**අදහස් හා යෝජනා වාරය**

- නයෝමාල් ඉඹුලාන මහතා විසින් මහා සභා වර්ථාව සමග අදාළ වර්ෂය තුල පැවති විධායක කමිටු රැස්විම් සදහා සහභාගි වු කමිටු සමාජිකයන් ගේ පැමිණිම පිළිබද වාර්ථාවක් අමුණන මෙන් යෝජනා කරන ලදි.

- ශමේන්ද්‍ර ධර්මසේන මහතා විසින් දැනට සමාජිකයින් වෙත යවන අවුරුදු සුභ පැතුම් පත වෙනුවට සමාජිකයින්ට උපන්දින සුභ පැතුම් පතක් යැවිමට යෝජනා කරන ලදි.

**උප ලේකම්තුමාගේ කථාව**

නව වර්ෂය සදහා තේරි පත් වු නිළධාරි මණ්ඩලය සමග සහයෝගයෙන් කටයුතු කිරිම සදහා සියළුම සමාජික සමාජිකාවන්ට අරාධනා කරමින් හා තම වටිනා කාලය වැය කරමින් මෙම අවස්ථාව සදහා සහභාගි වු විදුහල්පතිතුමාටත් මව් සංගමයේ නියෝජ්‍ය සභාපතිතුමාටත්, මව් සංගමයේ ලේකම්තුමා සහා මේ සදහා සහභාගි වු සියළුම සමාජික සමාජිකාවන්ට සැමට ස්තුතිය පුද කරමින් තම කථාව නිමා කරන ලදි.

මහා සභාවේ වැඩ කටයුතු අවසන් කිරිමෙන් අනතුරුව සියලු දෙනා සතුටින් විසිර ගියෝය.

ගයානි කොස්වත්තගේ

ප්‍රධාන ලේකම්